**හොරණ ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අගෝස්තු 08 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හොරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.21,500,000 ක මුදලක් පොදු මුදල් ගිණුමෙන් කර්මාන්ත මුදල් ගිණුමට මාරු කිරීමේදී සාවද්‍ය ලෙස මූලධන ආධාර ගිණුම බැර කිරීම නිවැරදි කිරීම සඳහා මූලධන ආධාර ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කර තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල් ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මුදල් පොතේ දෙවරක් සටහන් වූ ශේෂයක් ඉවත්කිරීම් ලෙස රු.6,682,829 ක් සමුච්චිත අරමුදල් ගිණුම හර කර මුදල් ගිණුම බැර කිරීම හේතුවෙන් මුදල් ශේෂය හා සමුච්චිත අරමුදල් ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ ණයහිමි ගිණුමට හර කරන ලද එකතු වටිනාකම රු.409,886 කට අදාලව විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායමට වඩා වැඩි වූ පුනරාවර්තන වියදම රු.43,597,495 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩි වූ පුනරාවර්තන වියදම රු.16,006,325 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.6,612,395 ක් වූ හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

#### 2.2.2 <u>වරිපනම් බදු</u>

(අ) විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 29 දින වන විට කනන්විල ප්‍රදේශයේ කර්මාන්තශාලා 19 කින් රු.982,315 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂයෙන් 2015 දෙසැම්බර් 31 වන විට රු.503,627 ක් අය විය යුතුව තිබුණි. තවද, රු.2,000 ට වැඩි හිඟ වරිපනම් ඒකක 181 ක හිඟ වරිපනම් බදු වටිනාකම රු.744,785 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 වන විට ඉන් ඒකක 162 කින් රු.677,718 ක් අය විය යුතුව තිබුණි.

(ආ) විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 29 දින වන විට ඉංගිරිය ප්‍රදේශයේ හිඟ වරිපනම් බදු ශේෂයෙන් රු.5,000 ට වඩා වැඩි ශේෂයක් සහිත වරිපනම් ඒකක 27 ක් පැවති අතර ඒවායේ හිඟ වටිනාකම රු.220,005 ක් විය. 2015 දෙසැම්බර් 31 වන විට සමස්ථ හිඟයෙන් රු.50,399 ක් අයවී තිබූ අතර හිඟ ශේෂය රු.169,606 ක් විය. එම හිඟය තුළ රබර් කර්මාන්තශාලාවකින් පමණක් රු.59,136 ක හිඟ වරිපනම් බදු ශේෂයක් අය නොවී පැවතුණි.

(ඇ) විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 29 දින වන විට පෝරුවදණ්ඩ ප්‍රදේශයේ සමස්ථ හිඟ බදු ශේෂය තුළ කර්මාන්ත ශාලා 05 කින් අයවිය යුතු එකතුව රු.313,857 ක් වූ වරිපනම් බදු ශේෂයෙන් 2015 දෙසැම්බර් 31 වන විට රු.239,678 ක් අය විය යුතුව තිබුණි.

#### 2.2.3 <u>කඩකුලී</u>

ඉංගිරිය උප කාර්යාලයට අයත් නව වෙළඳ සංකීර්ණයේ කඩකාමර 23 ක් පැවති අතර කඩ කාමර 21 කින් පමණක් මාසික කුලිය අයකරන බවත් ඉතිරි කඩකාමර 02 ක් විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 29 දින වන විටත් ටෙන්ඩර් කර නොතිබූ බවත් අනාවරණය විය.

#### 2.2.4 <u>මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 59,023,630 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

2.2.5 **<u>දැන්වීම් පුවරු ගාස්තු</u>**

2014 නොවැම්බර් 21 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය අනුව දැන්වීම් පුවරු 23 ක් සඳහා ලැබිය යුතු රු.286,750 ක බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2011 පෙබරවාරි 24 දිනැති විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/2011 දරන චක්‍රලේඛයේ 4.1 වගන්තියට අනුව අනියම් හා තාවකාලික සේවකයින්ගේ දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලේකම් හා ගණකාධිකාරී වෙත එවීමට කටයුතු කළ යුතු වුවත් එසේ නොකොට සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්ති භාර අරමුදල වෙත ප්‍රමාද වී ප්‍රේෂණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.635,045 ක් අදාල අරමුදල වෙත දඩ මුදල් වශයෙන් ගෙවා තිබුණි.

(ආ) 2002 සිට 2012 දක්වා කාලසීමාව තුළ එකතු කළ අගය මත බදු වෙනුවෙන් ගෙවිය යුතු මුදල් නොගෙවීම නිසා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත 2015 ජනවාරි 29 දින රු.1,068,912 ක් ගෙවා තිබූ අතර ඉන් රු.1,036,634 ක්ම 2002 සිට 2010 වර්ෂය දක්වා වූ කාලයට අදාල දඩ මුදල් විය.

(ඇ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාලවල පොත් බැහැර දෙන අංශයෙන් පාඨකයින් විසින් 2012, 2013, 2014 හා 2015 යන වර්ෂවලදී ලබාගෙන 2015 ජූනි 30 වන විටත් ආපසු භාර නොදුන් පොත් 335 ක වටිනාකම රු.89,964 ක් වූ අතර මෙම පොත් ආපසු ලබාගැනීමට හෝ ඒවායේ වටිනාකම අදාල පාර්ශවයන්ගෙන් අයකරගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) මිය ගිය, විශ්‍රාම ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 16 දෙනෙකුගෙන් අයවිය යුතු රු.63,521 ක් වූ ණය ශේෂය 2015 දෙසැම්බර් 31 දින වන විටද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 ඔක්තෝබර් 29 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී ගබඩා අයිතම 09 ක ඒකක 203 ක ඌනතාවයක් හා එක් අයිතමයක ඒකක 12 ක අතිරික්තයක් නිරීක්ෂණය විය.

**3.2** **<u>පරිසර බලපත්‍ර නිකුත් කිරීම</u>**

2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන හොරණ ප්‍රාදේශීය සභාවේ ගැසට් නිවේදනයේ සඳහන් පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පරිපාටිය ප්‍රකාරව පරිසර බලපත්‍ර නිකුත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පරිසර අධිකාරිය විසින් සභා බල ප්‍රදේශය තුළ පරිසර බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත 10 ක් හඳුනාගෙන ඇතත් විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 30 දින වන විට බලපත්‍ර නිකුත් කර තිබුණේ කර්මාන්ත 05 ක් සඳහා පමණි.

(ii) 2001 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පරිසර බලපත්‍ර අවලංගු වී තිබූ ආයතන 42 ක් සම්බන්ධයෙන් තවදුරටත් එම ආයතන පවත්වාගෙන යන්නේද පිළිබඳ තහවුරු කරගෙන නැවත බලපත්‍ර නිකුත් කිරීමට විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 30 වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) පරිසර බලපත්‍ර ලබාදිය හැකි ක්ෂේත්‍ර 10 ට අදාල ආයතන හඳුනාගෙන එම ආයතන වෙත බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබූ අතර බලපත්‍ර ඉල්ලුම් කරන අයට පමණක් පරිසර බලපත්‍ර නිකුත් කිරීමට පාරිසරික බලපත්‍ර ක්‍රියාවලිය සකස් වී තිබුණි. මේ හේතුවෙන් ප්‍රාදේශීය සභාවට ආදායමක් මෙන්ම ජනතාවට හිතකර පරිසරයක් සකසා දීමේ මූලික අරමුණු ඉටු නොවන බවද නිරීක්ෂණය විය.

3.3 **අවිධිමත් ගනුදෙනු**

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(i) වගන්තිය ප්‍රකාරව කිසියම් කාර්යයක් සඳහා ලබා දිය යුතු අත්තිකාරම් මුදල මුළු ඇස්තමේන්තුවෙන් සියයට 20 ක් ඉක්ම නොවිය යුතු වුවත් එයට පැටහැනිව සභාව සතු කැබ් රථයක් අළුත්වැඩියාව සඳහා මුළු ඇස්තමේන්තුවෙන් සියයට 50 ක් එනම් රු.114,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි.

(ආ) 2014 ජූනි 20 දිනැති අංක CSO/PTR/10/1/306 දරන බස්නාහිර පළාත් සහකාර ප්‍රධාන ලේකම් (පුහුණු) ගේ ලිපිය අනුව මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරි පුහුණු වැඩමුළුවකදී ගෙවනු ලබන දීමනාව, එම පුහුණු වැඩසටහන්වලට සහභාගී වන සම්පත් දායකයින්ට පමණක් වන නමුත් අවසාන ගිණුම සැකසීම වෙනුවෙන් බාහිර සම්පත් දායකයෙකුට පැයකට රු.1,200 බැගින් පැය 12 ක් සඳහා රු.14,400 ක් ගෙවා තිබුණි.

(ඇ) 2014 ජනවාරි 21 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ 3 A රීති අංක 02 ප්‍රකාරව සභාපතිවරයා 2014 ජනවාරි සිට රු.2,500 ක ස්ථිර ගමන් වියදම් දීමනාවක් ලබාගෙන තිබූ අතර 2014 ජනවාරි සිට 2015 මැයි දක්වා දින 270 ක් සඳහා රු.133,500 ක සංයුක්ත දීමනාවක්ද ලබාගෙන තිබුණි.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය